# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
## மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 08 |

## තෙවන වාර පරීක්ෂණය - 2023
## බුද්ධ ධර්මය - I, II

පාසලේ නම : ....................................................................

ඇතුළත් වීමේ අංකය : ....................................

කාලය - පැය 02යි.

**සැලකිය යුතුයි :**

**i. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**ii. අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

## I පත්‍රය

01. බුදුරජාණන් වහන්සේ විසින් මහා මංගල සූත්‍රයේ දී පුද්ගලයෙකු සැඳෑසමයේ දී අනුගමනය කළ යුතු යැයි දේශනා කළ කරුණක් වන්නේ,
   (1) පිදිය යුත්තන් පිදීම.  (2) කළගුණ සැලකීම.
   (3) ආර්ය සත්‍ය වටහා ගැනීම.  (4) ශිල්ප දැනීම.

02. බුදුරජාණන් වහන්සේ විසින් ''රජෝ හරණං, රජෝ හරණං'' යනුවෙන් ප්‍රකාශ කරමින් සුදු රෙදි කැබැල්ලක් පිරිමැදීමට ඉගැන්වූයේ,
   (1) සුනීත තෙරුන්ට ය.  (2) චුල්ලපන්ථක තෙරුන්ට ය.
   (3) රාහුල තෙරුන්ට ය.  (4) සෝපාක තෙරුන්ට ය.

03. ''වස්සකාර'' ඇමතිවරයා කුමන රජුගේ ඇමතිවරයෙක් ද?
   (1) සුද්ධෝදන රජුගේ ය.  (2) අමිතෝදන රජුගේ ය.
   (3) බ්‍රහ්මදත්ත රජුගේ ය.  (4) අජාසත්ත රජුගේ ය.

04. ''මහනෙල් සුවඳමය - කුඩ මසු පිළී ගඳමය
දෙකට එක දියමය - හොඳට නරකට දෙකට කටමය'' යන පද්‍යය ලියන ලද්දේ,
   (1) පැළෑනේ සිරි වජිරඥාන හිමියන් ය.  (2) වැලිවිට සරණංකර හිමියන් ය.
   (3) යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම හිමියන් ය.  (4) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ය.

05. ගිහියන් විසින් උපදවා ගත යුතු සැප හතරක් පිළිබඳ අනේපිඬු සිටුතුමන්ට දේශනා කළේ,
   (1) අග්ගඤ්ඤ සූත්‍රයේ දී ය.  (2) අණන සූත්‍රයේ දී ය.
   (3) මහා මංගල සූත්‍රයේ දී ය.  (4) කරණීය මෙත්ත සූත්‍රයේ දී ය.

06. ''ධර්ම රත්නයේ '' ගුණ අතුරින් ''සන්දිට්ඨිකෝ '' යන්නෙහි අර්ථය වන්නේ,
   (1) මාර්ගඵලවලට මෙලොවදීම පත් විය හැකි ය යන්නයි.
   (2) ධර්මය මුල මැද අග යන තුන් තැනම යහපත් ය යන්නයි.
   (3) ඒ මොහොතේම ප්‍රතිඵල ලඟා කර ගත හැකිය යන්නයි.
   (4) ඕනෑම අයෙකුට ධර්මය පිළිබඳ විමසා බැලිය හැකි යන්නයි.

07. බුදුරජාණන් වහන්සේගේ ශරීරය ආදාහනය කළ චිතකයෙහි විසිර නොගොස් පැවති ධාතූන් වහන්සේලා ගණන වූයේ,
   (1) එක් නමකි.  (2) දෙනමකි.  (3) සතර නමකි.  (4) සත් නමකි.

08. බෞද්ධ විවාහ මංගල උත්සවයක දී මනාල යුවළ පෝරුවට නංවනු ලබන්නේ,
   (1) නැන්දනියන් විසින් ය.
   (2) සහෝදරයින් දෙපලක් විසින් ය.
   (3) දෙමාපියන් විසින් ය.
   (4) මාමාවරුන් දෙදෙනෙකු විසින් ය.

09. පළමු සංගායනාවේ දී විනය පිටකයේ වගකීම පැවරුණේ,
   (1) අනුරුද්ධ තෙරණුවන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.
   (2) උපාලි තෙරණුවන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.
   (3) මහා කාශ්‍යප තෙරණුවන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.
   (4) සෙසු සියලුම වහන්සේලාට ය.

10. උපතිස්ස පිරිවැජියාට ''යේ ධම්මා හේතුප්පභවා....'' යන ගාථාව දේශනා කළේ,
   (1) රාහුල තෙරුන් විසින් ය.
   (2) ආනන්ද තෙරුන් විසින් ය.
   (3) අස්සජි තෙරුන් විසින් ය.
   (4) චන්න තෙරුන් විසින් ය.

(ලකුණු $2 \times 10 = 20$)

✸ **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා ලියන්න.**

11. බුදුරජාණන් වහන්සේ උතුම් විද්‍යා ගුණ අටකින් ද, චරණ ධර්ම පහළොවකින් ද, සමන්විත වන නිසා ........................................ නම් වන සේක.
12. බෝසතාණන් වහන්සේ සේනානි නියම් ගමෙහි අජපල් නුගරුක් සෙවණේ වැඩ සිටිය දී ........................................ පිළිගත් සේක.
13. කොසොල් රජුගේ පුරෝහිත බමුණාට දාව ........................................ බැමිණියට උපන් පුත්කුමරු අහිංසක නම් විය.
14. අපගේ දියුණුවට අනුන් උපකාර කරන්නේ නම් එය ........................................ ය.
15. කාව්‍යශේඛරය ග්‍රන්ථය රචනා කරනු ලැබුයේ ........................................ විසින් ය.

**(තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්, මණ්තානි, විජ්ජාචරණ සම්පන්න, අර්ථචරියාව, සුජාතාවගේ කිරිපිඬු දානය)**

(ලකුණු $2 \times 5 = 10$)

✸ **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල එන වාක්‍ය නිවැරදි නම් හරි (✓) ලකුණ ද වැරදි නම් වැරදි (✗) ලකුණ ද වරහන් (   ) තුළ යොදන්න.**

16. දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කරන ලද්දේ බරණැස ඉසිපතන මිගදායේ දී ය. (   )
17. ''පිළින්දවච්ඡ'' යනු කොසොල් රජුගේ ප්‍රධාන ඇමතිවරයා ය. (   )
18. පස්කම් සැපතේ ඇල්ම හෙවත් ඉඳුරන් පිනවීමේ ආශාව ''විභව'' තණ්හාවයි. (   )
19. මරණය යනු එක් භවයකට අයත් ජීවිතය සිඳී යාමයි. (   )
20. පින්තාලි තැබීම හා අම්බලම පැරණි ලාංකිකයින් සතුව පැවති සාමයේ සහජීවනයේ සංකේතයකි. (   )

(ලකුණු $2 \times 5 = 10$)

* *

## II පත්‍රය

**සැලකිය යුතුයි :**

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය සමඟ තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.**

01. (i) දම්සක් පැවතුම් සූත්‍රයේ දී තණ්හාව තුන් ආකාරය යැයි දේශනා කර තිබේ. ඉන් **දෙකක්** ලියන්න.
   (ii) ත්‍රිවිධ චෛත්‍ය අතුරින් **දෙකක්** ලියන්න.
   (iii) ඕනෑම පුද්ගලයකුට සමාජයට සංග්‍රහ කළ හැකි කරුණු සතරක් ''සතර සංග්‍රහ වස්තු'' ලෙස දේශනා කොට ඇත. ඉන් **දෙකක්** ලියා දක්වන්න.
   (iv) පොහොය දිනවල බෞද්ධයකුට සමාදන් විය හැකි **සීලයේ** වර්ග කීපයක් බුදු දහමේ ඉගැන්වේ. ඉන් වර්ග **දෙකක්** ලියා දක්වන්න.
   (v) **''වෘද්ධාපචායනය''** යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි ලියන්න.
   (vi) මියුළු නුවර වේදේහ රජුගේ අනුශාසක පඬිවරුන් අතුරින් **දෙදෙනෙකු** සඳහන් කරන්න.

(vii) පළමු සංගායනාව පැවැත්වූ ස්ථානය හා අනුග්‍රහය දැක්වූ රජු ලියා දක්වන්න.

(viii) සත්වයාගේ මරණය සතරාකාර බව බුදු දහමේ උගන්වයි. ඉන් ''කම්මක්ඛය'' ''ආයුක්ඛය'' යන මරණ කුමන හේතුවකින් සිදුවන්නේ දැයි ලියන්න.

(ix) ආගමික සහජීවනයට හේතුවන බෞද්ධ ලාංකිකයන් ද මැදිහත්ව පවත්වනු ලබන අන්‍ය ආගමික උත්සව **දෙකක්** ලියන්න.

(x) බුදුරජාණන් වහන්සේ මැරවීම සඳහා දේවදත්ත හිමියන් විසින් යෙදූ උපක්‍රම **දෙකක්** ලියන්න.

02. (i) බුදුරජාණන් වහන්සේ මැදිහත්ව ගැටලු විසඳූ බවට උදාහරණ **දෙකක්** ලියන්න.

(ii) දෙව්දත් හිමියන් සමග පැවිදිවූවන් අතුරින් **තිදෙනෙකුගේ** නම් ලියන්න.

(iii) බුදුරජාණන් වහන්සේ ගැටලු විසඳූ අයුරු එක් කථාවක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න.

03. (i) ඇස, නාසය යන ඉන්ද්‍රියන්ට ගෝචර වන්නේ (අරමුණු) මොනවාදැයි ලියන්න.

(ii) බුදු දහමින් ''උපාදානස්කන්ධ'' පහම දුක් සහගත බව ඉගැන්වේ. ඒ අතුරින් උපාදානස්කන්ධ **තුනක්** ලියා දක්වන්න.

(iii) බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාවට අනුව ''අටවැදෑරුම්'' දුකක් ලොව පවත්නා බව දේශනා කොට තිබේ. ඒ අතුරින් ''ජාතිය හෙවත් ඉපදීම'' දුකක් වන අයුරු ඔබේ වචනයෙන් ලියන්න.

04. (i) ශීල ශික්ෂාවේ පිහිටන ලද පුද්ගලයෙකුගේ සංවර වන ප්‍රධාන අංශ **දෙක** ලියා දක්වන්න.

(ii) පංච ශීලයේ දී සමාදන්වන ශික්ෂා පදවලට අමතරව දස ශීලයේ දී සමාදන්වන ශික්ෂා පද **තුනක්** ලියන්න.

(iii) මත්ද්‍රව්‍ය භාවිතයෙන් පුද්ගලයෙකු පිරිහීමට පත්වන ආකාරය කරුණු **තුනක්** යටතේ කෙටියෙන් පැහැදිලි කරන්න.

05. (i) වජ්ජි රාජ්‍ය ආක්‍රමණය කිරීමට අදහස් කළ රජු හා ඔහුගේ රාජ්‍ය කුමක් ද?

(ii) නීතිගරුකව ජීවත් වීමේ දී ලැබෙන ප්‍රයෝජන **තුනක්** ලියන්න.

(iii) බුදුරජාණන් වහන්සේ කාන්තාවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියා මාර්ග සම්බන්ධව කුඩා සටහනක් සකස් කරන්න.

06. (i) පළමු සංගායනාව ''පඤ්චසතිකා'' යනුවෙන් හඳුන්වන්නේ කුමක් නිසාදැයි ලියන්න. එදින ම රහත් භාවයට පත්වූ තෙරුණ් කවුරුන් දැයි ලියන්න.

(ii) විනය පිටකයට අයත් ග්‍රන්ථ අතුරින් **තුනක්** ලියා දක්වන්න.

(iii) පළමු සංගායනාව පැවැත්වූ අයුරු කෙටියෙන් ලියන්න.

07. (i) ඛේම මහරහතන් වහන්සේ විසින් ආදාහන මළුවෙන් ලබා ගන්නා ලද බුදුරජාණන් වහන්සේගේ ''වම් දළදාව'' භාර කළේ කුමන රට කුමන රජු වෙත දැයි ලියන්න.

(ii) දළදා වහන්සේ මුල් කරගෙන ''සතර මහා මංගල්‍යය'' නමින් හැඳින්වෙන ප්‍රධාන පූජාවක් වාර්ෂිකව සිදු කෙරේ. එම මංගල්‍යයන් අතුරින් **තුනක්** ලියන්න.

(iii) දළදා වහන්සේ වෙත සිදුකරන ''සප්තාහික'' පූජාව පිළිබඳ සටහනක් ලියා දක්වන්න.

* * *